

# කොඩියගෙ ළම

## ලක්ෂමන් කොඩිතුවක්කු

### "අනේ මට වීරයෙක් එපා. මට මගේ සැමියා ගෙනත් දෙන්න. දරුවන්ට තාත්තා ගෙනත් දෙන්න."

මේ වදන් මගේ සවන්වලට වැටී  දෑස් සිසාරා යන්නේ, මෑතකදී පාතාලයේ මැරයෙකුගේ ගිනි අවියකින් වෙඩි කා මිය ගිය පොලිස් කොස්තාපල්වරයාගේ බිරිඳගේ මුවිනි. මාතර ස්වර්ණාභරණ සාප්පුවක් කොල්ල කන්නට පැමිණි පාතාල පිරිස අතින් ඔහුට වෙඩි වැදිණි. තමන්ගේ ජීවිතය බේරාගෙන කවුරුන් හෝ මරා දමා තම අරමුණ සඵල කරගැනීම මැරයන්ගේ අභිප්‍රායයි. එහෙත් කොස්තාපල්වරයාගේ ශරීරය වෙනුවෙන්, ආයුධ සොයා යෑමේ මුවාවෙන්, කොල්ලයට සම්බන්ධ පාතලයේ මැරයකුගේ ජීවිතයද මේ වනවිට බිලි වී අවසන් බව අප කවුරුත් දනිති.  ඒ අනාදිමත් කාලයක සිට පැවත එන පොලිසියේ දතට දත න්‍යායේ සැලැස්ම හා පොලිස් යහපාලනයේ තවත් බිල්ලක් ලෙසය. කොස්තාපල්වරයාගේ බිරිඳගේ ආයාචනය ඇසුණු විට මට මතක්වන්නේ අපේ රටේ වසර 30 ක් තිස්සේ ඇදී ගිය ජනවාර්ගික යුද්ධයයි. ඒ යුද්ධයේදි මියගිය, ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ පිරිස මෙන්ම එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නැති වී ගිය ජීවිතයි.

වීරයන් අවශ්‍ය කාටද? රටකට වීරයන් අත්‍යාවශ්‍යද ? මේ සියලු අවශ්‍යතා පැන නගින්නේ එකිනෙකාගේ පෞද්ගලික වුවමනා එපාකම් හා බලය වෙනුවෙන් බව මගේ හැඟීමයි.  අනාදිමත් කාලයක සිට භූමිය, ආහාර, ජලය හා බලය වෙනුවෙන් මිනිසා එකිනෙකා කුළල් කා ගනිමින් යුද්ධ කලහ. එහිදී මිය ගියද ජයග්‍රහණය කළ පිරිස බොහෝ විට වීරයන් වු අතර, පරාජය ලත් පිරිස ද්‍රෝහියන් බවට පත්විය. වීරයන්ට පළඳනා, පදක්කම්, සම්මාන, මිල මුදල්, ඉඩකඩම්, නම්බුනාම ලැබුණු අතර, ද්‍රෝහියන්ට, උන් මැරී වැටුණ බිම් අඟල ද නැතිව ගියේ, සටන් කර අහිමි වී ගිය පස් යටම දිරාපත් වෙමිනි.

අතීතයෙන් අනාගතයට එනවිට වීරයන්ගේ නම් හා ඔවුන් කළ වීරකම් පිළිබඳව අප දකින්නට කියවන්නට කැමත්තෙන් සිටි කාලයක් තිබිණි.  පොත්පත්වලින් සිනමා රූප තුළින් ඒවා කියවා බලා අපද වීරයන් වෙන්නට ඇඟිලි ගැන්න අයුරු තාම මතකය.එම වීර රසය කෙතරම් තිබුණත් අනුන්ගේ වීරකම් අපට පෙන්නුවත්, මැරිල හරි කමක් නැහැ උඹ වීරයෙක් වෙයන් කියන දෙමාපියන් මට තාමත් මුණ ගැසී නැත. වීර පුරන් අප්පු, ගොන්ගාලේගොඩ බණ්ඩා, සූරසරදියල්ලා අපට වීරයන් වෙද්දී, සුද්දාට ඔවුන් එදා ද්‍රෝහියන් විය. බලය තිබූ සුද්දා ඔවුන්ට එරෙහි වූවන් ද්‍රෝහියන් කළේ, හිතවත් එකාට පඬුරු, තාන්න මාන්න, ඉඩකඩම් දී මේ පුංචි රටේ බලගතු, ඔවුනට හිතැති රටපාලනය කරන්නට වරම් ලත් දේශපාලන වීරයන් බවට පත් කරමිනි. පසු කාලෙක සුද්දාගේ නාමික නිදහසෙන් පසු, රට පාලනය කළ පාලකයන් විසින් තමන්ගේ ඉදිරි පැවැත්ම වෙනුවෙන් රට ඇතුලේ ඔවුනට හිතැති වීරයන් බිහිකරමින් තමන්ගේ බලය හා පාලනය ඉදිරියට රැගෙන යාමට අඩිතාලම දමාගන්නට කටයුතු කළේය. එසේම සුද්දා දෝහියන් කළ අපේම මිනිසුන්ගේ පිළිම නෙලා මල් මාලා දමමින්, ඔවුන් නැවත විරුවන් බවට පත් කළේ රටේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් නොව තම තමන්ගේ පැවත්ම වෙනුවෙනි.

අපේ මේ පුංචි රටට වීරයන් අවශ්‍ය ද ? නැත්නම් අනාගත දියුණුව වෙනුවෙන් එකිනෙකා අතර අන්‍යෝන්‍ය සහජීවනය අවශ්‍ය ද ? මේ සියලු දේට පැහැදිලි පිළිතුරක් පොලිස් භටයාගේ බිරිඳගේ මුවින් පිටවුණු බව මම විශ්වාස කරමි. තම සැමියා එන තුරු බලා සිටින බිරින්ඳෑවරු,මෙන්ම පිය වරු එනතුරු බලා සිටින දරුවන් කොතෙක් අප රටේ සිටීද? එයට තවත් උදාහරණයන් ලෙස මගේ මතකයට බොහෝ දෑ ගලාගෙන එයි. එයින් එක් සිද්ධියක් ලෙස මම කෙටි

